“ජුමුආ දිනයේ ස්නානය කිරීමත් කට පිරිසිදු කිරීමත් සුවඳ විළවුන් ඇත්නම් එය ගැල්වීමත් වැඩිවියට පත් සෑම කෙනෙකුටම අනිවාර්යය වන්නේය.”

අම්ර් ඉබ්නු සලීම් අල් අන්සාරී (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී: ඔහු:
“මම අබූ සඊද් මත සාක්ෂි දරමින් පවසමි.” ඔහු “මම අල්ලාහ්ගේ දූතයාණන් මත සාක්ෂි
දරමින් පවසමි” යැයි පවසා සිටි බව ප්රකාශ කර සිටියහ: “ජුමුආ දිනයේ ස්නානය කිරීමත් කට පිරිසිදු කිරීමත් සුවඳ විළවුන් ඇත්නම් එය ගැල්වීමත් වැඩිවියට පත් සෑම කෙනෙකුටම අනිවාර්යය වන්නේය.”
[صحيح] [متفق عليه]

ජුමුආව අනිවාර්යය වූ වැඩිවියට පත් සෑම මුස්ලිම්වරයකුගේම වගකීම තුළ එය අනිවාර්යය වන අතර ජුමුආ දිනයේ ස්නානය කිරීමද වැදගත් බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පැහැදිළි කළහ. එමෙන්ම මිස්වාක් දැහැටියෙන් හා එවන් බුරුසුවකින් තම දත් මැද ගැනිමත් කවර සුවදක් වුව ද අත්තර් වැනි සුවද විළවුන් ගල්වා ගැනීමත් වැදගත් වන්නේය.

http://sunnah.global/hadeeth/si/show/10036